Lesson 43 **ඔහු ඇයව බඳින්න ඉන්නේ**

මේ පාඩමේදී අපි ඉගෙන ගන්න යන ව්‍යාකරණ රටාව ඉතාම වැදගත් රටාවක් .එය සිදුවෙන්නට ඉතාම ආසන්න ක්‍රියාවක් ගැන කියවෙන වියරණ රටාවක් . යම් ක්‍රියාවක් කරන්න ඉන්නේ කියන අදහස ඉන් ලැබෙන්නේ . මෙය සැදෙන්නේ මේ ආකාරයට

- කතෘ + am /is /are + to + ක්‍රියාව

උදාහරණ වාක්‍යය ගෙන බලමු

He is to marry her
ඔහු ඇයව බඳින්න ඉන්නේ

They are to migrate to Europe
ඔවුන් යුරෝපෙට යන්න ඉන්නේ

She is to resign from her job
ඇය අගේ රස්සාවෙන් අයින් වෙන්න ඉන්නේ (resign - රිසයින් - අස්වෙනවා (තනතුරකින් , රැකියාවකින් )

I am to go there to see them
මම එහෙ යන්න ඉන්නේ ඔවුන් බලන්න

We are to arrange a party for the new couple
අපි අලුත් ජෝඩුවට පාටි එකක් ලැහැස්ති කරන්න ඉන්නේ

They are to sell their land
ඔවුන් ඔවුන්ගේ ඉඩම විකුනන්න ඉන්නේ

He is to meet the doctor tomorrow
ඔහු හෙට ඩොක්ටර්ව හමුවෙන්න ඉන්නේ

She is to start a new business
ඇය අලුත් ව්‍යාපාරයක් ආරම්භ කරන්න ඉන්නේ

They are to go abroad next month
ඔවුන් ලබන මාසේ රට යන්න ඉන්නේ

We are to buy a new car
අපි අලුත් කාර් එකක් ගන්න ඉන්නේ

He is to speak at the event
ඔහු ඉවෙන්ට්(උත්සව අවස්ථාවේ ) එකේ කතා කරන්න ඉන්නේ

The students are to sit for the exam
සිසුන් විභාගෙට වාඩි වෙන්න ඉන්නේ

I am to start my new job next week
මම ලබන සතියේ මගේ අලුත් රස්සාව ආරම්භ කරන්න ඉන්නේ

She is to get married next month
ඇය ලබන මාසේ බඳින්න ඉන්නේ (get married - ගෙට් මැරීඩ් - විවාහ වෙනවා )

The company is to close down its business
සමාගම එහි ව්‍යාපාර වහල දාන්න ඉන්නේ

She is to join a new company next month
ඇය ලබන මාසේ අලුත් කොම්පැනියකට ජොයින් වෙන්න ඉන්නේ

They are to renovate their house
ඔවුන් ඔවුන්ගේ ගෙදර අලුත්වැඩියා කරන්න ඉන්නේ (renovate - රෙනවේට් - අලුත් වැඩියා කරනවා )

- මෙහි අතීත කාලය

❖ was / were +to + ක්‍රියාව . එවිට අදහස් වෙන්නේ ඒ ක්‍රියාව කරන්න හිටියා , නමුත් කරන්න බැරි වුනා කියන එක. ඒ ක්‍රියාව සිද්ධ වුනේ නැහැ

She was to come (but she didn’t for some reason )
ඇය එන්න හිටියේ (නමුත් ඇය ආවේ නැහැ යම් හේතුවකට)

I was to give this to you ( But I forgot )
මම ඔයාට මේක දෙන්න හිටියේ ( නමුත් මට අමතක වුනා )

I was to tell you ( But I forgot )
මම ඔයාට කියන්න හිටියේ ( නමුත් මට අමතක වුනා )

We were to arrange a party ( but we couldn’t )
අපි පාටි එකක ලැහැස්ති කරන්න හිටියේ ( නමුත් අපට බැරි වුනා )

I was to call her (but I couldn’t)
මම ඇයට කෝල් කරන්න හිටියේ (නමුත් මට බැරි වුනා )

He was to meet his friends (but he couldn’t)
ඔහු ඔහුගේ යාලුවන්ව හමුවෙන්න හිටියේ (නමුත් ඔහුට බැරි වුනා)

I was to visit you yesterday (but I got busy)
මම ඊයේ ඔයාව බලන්න එන්න හිටියේ (නමුත් මම කාර්යබහුල වුනා)

They were to finish the work by today (but they didn’t)

ඔවුන් අද වෙනකොට  වැඩේ ඉවර කරන්න හිටියේ (නමුත් ඔවුන් කලේ නැහැ )

We were to leave early in the morning (but we overslept)
අපි උදේම පිටත් වෙන්න හිටියේ (නමුත් අපිට නින්ද ගියා ) (oversleep - ඕවර් ස්ලීප් - වැඩිපුර නිදා ගන්නවා )

She was to attend the meeting (but she was sick)
ඇය මීටින් එකට සහභාගී වෙන්න හිටියේ (නමුත් ඇය අසනීප වුනා)

He was to start the project last week (but he postponed it)
ඔහු පසුගිය සතියේ ප්‍රොජෙක්ට් එක ආරම්භ කරන්න හිටියේ (නමුත් ඔහු එය කල් දැම්මා )

I was to bring the documents (but I left them at home)
මම ලියකියවිලි අරගෙන එන්න හිටියේ (නමුත් මම ඒවා ගෙදර දාල ආවා)

They were to move into their new house (but it wasn't ready)
ඔවුන් අලුත් ගෙදරට යන්න හිටියේ (නමුත් එය  සූදානම්ව තිබුනේ නැහැ )

We were to play today (but it rained)
අපි අද සෙල්ලම්  කරන්න හිටියේ (නමුත් වැස්සා )

She was to receive the award (but the event was canceled)
ඇයට සම්මානය ලබාගන්න හිටියේ (නමුත් වැඩසටහන අවලංගු වුනා) (recieve - රිසීව් - ලැබෙනවා , ලබා ගන්නවා , බාර ගන්නවා ) (award - අවෝඩ් - තෑග්ග  , සම්මානය )

He was to fly to Dubai (but his flight got delayed)
ඔහු ඩුබායි යන්න හිටියේ (නමුත් ඔහුගේ ගුවන් ගමන ප්‍රමාද වුනා) (flight - ෆ්ලයිට් - ගුවන් ගමන )

I was to meet you at 5 (but I got late)
මම 5 ට ඔයාව හමුවෙන්න හිටියේ (නමුත් මම ප්‍රමාද වුනා)

They were to get married this month (but they changed the date)
ඔවුන් මේ මස විවාහ වෙන්න හිටියේ (නමුත් ඔවුන් දිනය වෙනස් කළා)

We were to start the class today (but the teacher was absent)
අපි අද පංතිය ආරම්භ කරන්න හිටියේ (නමුත් ගුරුතුමා පැමිණියේ  නැහැ)

- <u>ඉහත am /is /are + to  + ක්‍රියාව යන රටාවට about  එකතු වුනොත් එවිට  අදහස් වෙන්නනේ එම ක්‍රියාව වීමට ඉතාම ආසන්නයි  කියන එක. ඒ කියන්නේ ඒ ක්‍රියාව වෙන්න ඔන්න මෙන්න කියන එක</u>

He is about to go
ඔහු යන්න හදන්නේ (යන්න ඔන්න මෙන්න)

She is about to cry (stop teasing her )
ඇය අඩන්න හදන්නේ (අඩන්න ඔන්න මෙන්න) (ඇයට කොලොප්පන් කරන එක නවත්තන්න )

That tree is about to fall down (don't go near it )
අර ගහ වැටෙන්න ඔන්න මෙන්න (ඒක  ලගට යන්න එපා )

They are about to migrate to Europe (They are packing up )
ඔවුන් යුරෝපෙට යන්න හදන්නේ (ඒගොලොලෝ බඩු පැක් කරනවා ) (pack  up - පැකප් - පැක් කරනවා )

They are about to close the gates ( Go in quickly ! )
ඔවුන් ගේට්ටු වහන්න හදන්නේ (ඉක්මනට ඇතුලට යන්න )

We are about to start the programme (Come in quickly )
අපි වැඩසටහන පටන් ගන්න හදන්නේ (ඉක්මනට ඇතුලට එන්න )

She is about to leave the house
ඇය ගෙදරින් පිටත් වෙන්න හදන්නේ

They are about to sign the agreement
ඔවුන් ගිවිසුමට අත්සන් කරන්න හදන්නේ (agreement - ඇග්‍රීමන්ට් - එකඟතාවය , ගිවිසුම )

I am about to close  this
මම මේක වහන්න හදන්නෙ

The bus is about to start moving
බස් එක ගමන් අරඹන්න හදන්නේ (move - මූව් - ගමන් කරනවා)

The child is about to fall asleep
ළමයා නිදා ගන්න හදන්නේ ( fall asleep - ෆෝල් ඇස්ලීප්- නින්දට වැටෙනවා )

He is about to lose his temper
ඔහුගේ ඉවසීම නැතිවෙන්න ඔන්න මෙන්න (ඔහුට කේන්ති යන්න ඔන්න මෙන්න)
(lose -ලූස් - නැතිවෙනවා) (temper - ටෙම්පර් - මනෝ ස්වභාවය ) (කාගේ හරි temper එක නැතිවෙනවා කියන්නේ එයාට කේන්ති යනවා කියන එක )

She is about to tell us something important
ඇය අපට වැදගත් දෙයක් කියන්න හදන්නේ

I am about to give it up
මම ඒක අල්ල දාන්න හදන්නේ

They are about to open the shop
ඔවුන් ශොප් එක විවෘත කරන්න හදන්නේ

It is about to rain
වහින්න ඔන්න මෙන්න

- මෙහි අතීත කාලය එන්නේ was /were about to + ක්‍රියාව .එවිට හැඟවෙන්නේ ඒ ක්‍රියාව සිදුවීමට  ඉතාම ආසන්නව තිබුනා කියන එක

ඔබ දන්නවා අපි කලින්  ගත්ත මෙන්න මේ රටාවේදී ( was / were to + ක්‍රියාව ) ඒ ක්‍රියාව කරන්න හෝ වෙන්න සිටියා නමුත් එය සිදුවුනේ නැහැ . ඉහත අපි ගත්ත උදාහරණ දෙකක්ම  නැවත අරගෙන බලමු

I was to visit you yesterday (but I got busy)
මම ඊයේ ඔයාව බලන්න එන්න හිටියේ (නමුත් මම කාර්යබහුල වුනා)

They were to finish the work by today (but they didn't)
ඔවුන් අද වෙනකොට  වැඩේ ඉවර කරන්න හිටියේ (නමුත් ඔවුන් කලේ නැහැ )

ඉහත උදාහරණ දෙකේදීම ඒ ක්‍රියාව සිද්ධ වුනේ නැහැ

අපි දැන් කතා කරන මේ රටාවේදී ( was / were about to + ක්‍රියාව ) එවැනි දෙයක් හැඟ වෙන්නේ නැහැ. ක්‍රියාව සිද්ධ වුනාද නැද්ද අපි දන්නේ නැහැ. මොකද එවැනි  අදහසක් කියවෙන්නේ නැහැ. ඒ වාක්‍යයත් එක්ක එන අනෙකුත් වාක්‍යය වලින් අපිට හිතාගන්න වෙනවා ඒක  සිදුවුනාද නැද්ද කියලා. සමහර විට සිදුවුනා වෙන්න පුළුවන්, සිදු නොවුනා වෙන්න පුළුවන්, නමුත් ඒක අදාළ නැහැ

I was about to close the gate
මම ගේට්ටුව වහන්න හැදුවා විතරයි

They were about to start the meeting
ඔවුන් රැස්වීම පටන් ගන්න ඔන්න මෙන්න තිබුනේ

She was about to open the door
ඇය  දොර අරින්න හැදුවා විතරයි

We were about to eat dinner
අපි ඩිනර් ගන්න හැදුවා විතරයි

They were about to cancel the event
ඔවුන් වැඩසටහන අවලංගු කරන්න ඉතාම ආසන්නව හිටියේ

She was about to leave the house when the phone rang
ඇය ගෙදරින්  පිටත් වෙන්න හැදුවා විතරයි ෆෝන් එක වදින කොට

I was about to sleep when you called
මම නිදා ගන්න හැදුවා විතරයි ඔයා කෝල් කරන කොට

The bus was about to depart when I wanted to go to the toilet
බස් එක පිටවෙන්න ඔන්න මෙන්න තිබුනේ මට ටොයිලට් එකට යන්න ඕන වෙන කොට
(depart - ඩිපා(ර්)ට්- පිටත් වෙනවා)

She was about to cry. So I told them to stop teasing her
ඇය  අන්දන්න අඬන්න ඔන්න මෙන්න හිටියේ , ඒ නිසා මම ඔවුන්ට කිව්වා
ඇයට  විහිලු කරන එක නවත්තන්න කියලා  (tease -ටීස් - විහිලු තහළු කරනවා )

They were about to start the journey when it suddenly started raining.
ඔවුන් ගමන් ආරම්භ කරන්න හැදුවා විතරයි හදිසියේම වැස්සක් වැටෙන්න පටන් ගන්න කොට

She was about to finish the work, when the manager asked her to do overtime
ඇය වැඩ ඉවර කරන්න හැදුවා විතරයි මැනේජර් ඇයට වැඩිපුර වෙලා වැඩ කරන්න කියන කොට

ප්‍රයෝගික කතාවේදී බොහොම සුහුරු ලෙස අදහස් ප්‍රකාශ කරන්න ඒ වගේ රටාවන් ඉතා වැදගත් . ඒ නිසා ඒවා හොදින් ග්‍රහණය කරගන්න , මෙහි තිබෙන වාක්‍යය ඔබ මතක තබා ගත්තොත් , ඒවා ඉතාම ප්‍රයෝජනවත් වේවි ප්‍රයෝගික ජිවිතයේ විවිධ අවස්තාවන් වල හොදින් අදහස් පල කිරීමට

# SPOKEN ENGLISH

මෙයත් හොද කතා බහක් . කාර්යාලයීය පරිසරයක නිවාඩු ඉල්ලීමක් සම්බන්ද කතා බහක්. ඒ වුනත් ඒ තුල නොයෙක් දෑ කතා බහ වෙනවා . මේ කතා බහ තුල ඔබට ප්‍රයෝජනවත් වන වාක්‍ය ගොඩාක් තියෙනවා. ඒවා හොදින් අධ්‍යනය කර මතක තබා ගෙන භාවිත කරන්න උත්සාහ කරන්න. මෙහි අඩංගු වාක්‍යයන් ව්‍යාකරනානුකූලව ඉතාම නිවැරදි සහ වඩාත් ස්වභාවික වාක්‍යයන්. වැදගත්ම දේ තමයි, මේවා සොකඩ ඉංග්‍රීසි නොවෙයි, ඒවා ඔබට ලාංකිකයන් සමග පමණක් නොවෙයි ඕනෑම ඉංග්‍රීසි සුද්දෙකු සමග වුවත් නොබියව පාවිච්චි කල හැකි මට්ටමේ ඉංගීසි. ඒ නිසා ඒවා හොදින් අධ්‍යනය කරන්න , හොදින් මතක තබා ගන්න , නොබියව භාවිතා කරන්න. මේ ඉංග්‍රීසි , අනෙකුත් ඉංග්‍රීසි කතා කරන්නන් අතර ඔබව ඉහලින් තැබිය හැකි මට්ටමේ ඉංග්‍රීසි

Conversation – Asking for leave (නිවාඩු ඉල්ලීම)

A- Hi Achini , Is the boss in ?
හායි අචිනි , ඉස් ද බොස් ඉන් ?
හායි අචිනි , බොස් ඉන්නවද

B- Hi Sachin,yes, he is in
හායි සචින් , යස් , හී ඉස් ඉන්
හායි සචින් , ඔව් , ඔහු ඉන්නවා

A- Can I meet him for a while ? Just for 5 minutes
කැන් අයි මීට් හිම් ෆෝර වයිල් ? ජස්ට් ෆෝ ෆයිව් මිනිට්ස්
මට එයාව පොඩ්ඩකට හම්බ වෙන්න පුලුවන්ද ? විනාඩි 5කට

B He is very busy this morning. Let me check . . .
හී ඉස් වෙරි බිසී දිස් මෝනින් , ලේට් මී චෙක් …
ඔහු ගොඩක් බිසී අද උදේ, ඉන්න බලන්න …

He is on a phone call , I will ask him once he is off the phone
හී ඉස් ඔන් අ ෆෝන් කෝල් , ,අයි විල් ආස්ක් හිම් වන්ස් හී ඉස් ඕෆ් ද ෆෝන්
ඔහු ෆෝන් කෝල් එකක , මම අහන්නම් ෆෝන් එක තියපු ගමන්
(මෙහි once කියන්නෙ වහාම ,විගසම කියන එක )

A Ok Thanks . Is he in a good mood today ?
ඕකේ, තෑන්ක්ස් , ඉස් හී ඉන් අ ගුඩ් මූඩ් ටුඩේ ?
හරි , තෑන්ක්ස් , අද එයාගේ මූන හොඳද ?

B Cannot say exactly . His mood changes quickly . Why ?... Have you got a problem to discuss with him ?
කැනොට් සේ එක්සැට්ලි. හිස් මූඩ් චේන්ජස් ක්වික්ලි . වයි ?... හැ ව් යූ ගොට් අ ප්‍රොබ්ලම් ටු ඩිස්කස් විත් හිම් ?

හරියටම කියන්න බෑ , එයාගේ මූඩ් එක වෙනස් වෙනවා ඉක්මනට , ඇයි ?
ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවද එයත් එක්ක කතා කරන්න
(Have you got = Do you have )

A Yes, Achini, I need 3-4 days leave. My wife's ill and I have to go back to my hometown. My section head refused to give me any more leave unless I get the permission from the GM
යස් අචිනි , අයි නීඩ් 3-4 ඩේස් ලීව්. මයි වයිෆ් ඉස් ඉල් ඇන්ඩ් අයි හැව් ටු ගෝ බැක් ටු මයි හෝම්ටවුන් .මයි සෙක්ෂන් හෙඩ් රිෆියුස්ඩ් ටු ගිව් මී එනි මෝ ලීව් අන්ලස් අයි ගෙට් ද ප(ර්මි)ෂන් ෆ්‍රොම් ද ජී එම්
ඔව් අචිනි , මට දවස් 3-4 ක් නිවාඩු ඕනා.මගේ වයිෆ් අසනීපෙන් , මට ගමට යන්න ඕනා ,මගේ අංශ ප්‍රධානියා තවත් නිවාඩු දෙන්න බෑ කිව්වා මම ජී එම් ගෙන් අවසරයක් නොගත්තොත්

B Oh, I am sorry to hear that. What's wrong with her ?
ඕ අයෑම් සොරි ටු හිය(ර්) දැට්. වට්ස් රෝං විත් හ(ර්) ?
කණගාටුයි ඒ ගැන අහන්න, මොකක්ද ඇයට වෙලා තියෙන්නේ ?

A She has fallen ill suddenly , she has body weakness, fatigue and sleeplessness
ෂී හැස් ෆෝලන් ඉල් සඩින්ලි . ෂි හැස් බොඩි වීක්නස්, ෆටීග් ඇන්ඩ් ස්ලීප්ලස්නස්
ඇය හදිස්සියේම ලෙඩ වෙලා , එයාට් ඇඟට පන නැති ගතිය , මහන්සිය , නින්ද යන්නේ නැති එක තියෙනවා

B Has she seen a doctor?
හැස් ෂී සීන් අ ඩොක්ටර් ?
එයා ඩොක්ටර් කෙනෙක්ව බලලද ? (ඩොක්ටර් කෙනෙක් ලගට ගිහිල්ලද ?)

A- Yes , she has, (she has seen a doctor ) , He advised her not to exert herself too much and take good rest for a few days
යස් ෂී හැස් , හී ඇඩ්වයිස්ඩ් හ(ර්) නොට් ටු එක්ස(ර්ට්) හ(ර්සෙල්ෆ් ටූ මච් ඇන්ඩ් ටේක් ගුඩ් රෙස්ට් ෆෝර ෆිව් ඩේස්
ඔව්, එයා බලලා, ඔහු කියලා තියෙනවා වැඩිය මහන්සි වෙන්න එපා කියලා, දවස් කීපයක් විවේක ගන්න කියලා (exert කියන්නෙ අධික ලෙස වෙහෙසෙනවා)

B- Is there anyone there to help her ?
ඉස් දෙයා(ර්) එනි වන් දෙයා(ර්) ටු හෙල්ප් හ(ර්) ?
කව්රු හරි ඉන්නවද එහෙ ඇයට උදව් කරන්න

A Only my mother, but she is also not so well, she has numerous ailments, It's difficult for her to attend to my wife, what's why I need to be there at least for a few days
ඔන්ලි මයි මද(ර්) ,බට් ෂී ඉස් ඕල්සෝ නොට් සෝ වෙල් .ෂි හෑස් නියුමරස් ඒල්මන්ට්ස් ,ඉට්ස් ඩිෆිකල්ට් ෆෝ හ(ර්) ටු ඇටෙන්ඩ් ටු මයි වයිෆ්, දැට්ස් වයි අයි නීඩ් ටු බී දෙයා(ර්) ඇට් ලීස්ට් ෆෝ අ(ෆෝර ) ෆිව් ඩේස්
මගේ අම්ම විතරයි ,නමුත් එයාටත් එච්චරම හොඳ නෑ , එයාට එක එක අමාරු

තියෙනවා , එයාට අමාරුයි මගේ වයිෆ්ට සාත්තු කරන්න , ඒකයි  මම එහෙ ඉන්න ඕනා අඩු ගානේ දවස් කීපයක් වත් (numerous- ගනනාවක්/ බොහෝ ) ( ailment - ඒල්මන්ට් - අසනීපය )

B- Oh, he is off the phone, let me check with him if he can give you 5 minutes
ඕහ් , හී ඉස් ඕෆ් ද ෆෝන්, ලේට් මී චෙක් විත් හිම් ඉෆ් හී කැන් ගිව් යූ ෆයිව් මිනිට්ස්
ආ, දැන් එයා ෆෝන් එකේ නැහැ , මම බලන්නම් එයාට් පුලුවන්ද කියල ඔයාට විනාඩි 5ක්  දෙන්න

Excuse me sir, Sachin wants to meet you for a while
එක්ස්කියුස් මී ස(ර්) ,සචින් වොන්ට්ස් ටු මීට් යූ ෆෝර වයිල්
සර්, සචින්ට සර්ව හම්බ වෙන්න ඕනලු පොඩි වෙලාවකට (for a while – පොඩ්ඩකට / ටිකකට)

C- Ok , Ask him to wait 5 minutes until I go through this document
ඕකේ , ආස්ක් හිම්  ටු වේට් 5  මිනිට්ස් අන්ටිල් අයි ගෝ ත්‍රෑ දිස් ඩොකියුමන්ට්
හරි , එයාට  විනාඩි 5ක් ඉන්න කියන්න මම මේ ඩොකියුමන්ට් එක කියවනකල් (මෙතන go through කියන්නනෙ කියවනවා කියන අදහස )

B- Ok sir , Thank you
ඕකේ ස(ර්) තැනක් යූ
හරි , තැනක් යු සර්

Sachin ,He asks you to wait 5 minutes
සචින් ,හී  ආස්ක් යූ  ටු වේට් ෆයිව් මිනිට්ස්
සචින් , එයා කියනවා ඔයාට මිනිත්තු 5ක් ඉන්න කියලා

After 5 miniutes ….
මිනිත්තු 5කට පසු

C- Ok Achini , send him in
ඕකේ  අචිනි , සෙන්ඩ් හිම්  ඉන්
හරි සචිනි , එයාව ඇතුලට එවන්න

A- Good morning sir
ගුඩ් මෝනිං සර්

C- Good morning Sachin . What’s the problem ?
ගුඩ් මෝනිං  සචින් , වට්ස්  ද ප්‍රොබ්ලම් ?
ගුඩ් මෝනින් සචින් , මොකක්ද ප්‍රශ්නේ ?

A- Sir , my wife is ill , I need to go to my hometown to take care of her for a few days .
ස(ර්) , මයි වයිෆ් ඉස් ඉල් , අයි නීඩ්  ටු ගෝ ටු මයි හෝම් ටවුන් ටු ටේක්

කෙයා(ර්) ඔෆ් (කෙයාරොෆ්) හ(ර්) ෆෝර ෆිව් ඩේස්
සර්, මගේ වයිෆ් අසනීපෙන් , මට ගමට යන්න ඕන ටික දවසකට එයාව
බලාගන්න
(ඉහත I need to ...කියන තැන I want to ...කියලා කියන්න බැරිද ? මේ දෙක
මුලිකව සමානයි. නමුත් දෙක අතර සියුම් වෙනසක් තියෙනවා.
I want to ...(do something) කිව්වොත් එතන හැගවෙන්නෙ ඒ දේ කරන්න අදාල
පුද්ගලයට තිබෙන පෞද්ගලික කැමැත්ත ,වුවමනාව
I need to ...(do something) කිව්වොත් ඒ දේ කරන්න ඒ පුද්ගලයට සිදුවෙනවා ඒ ක්‍රියාව
කරන්න යම් බාහිර සාධක හෝ පවතින තත්වයන් මත)

C- What has happened to her ?
වට් හැස් හැපන්ඩ් ටු හ(ර්) ?
මොකක්ද ඇයට වෙලා තියෙන්නේ ?

A- She has fallen ill suddenly , she has body weakness , our family doctor has asked her take rest for a few days
ෂී හෑස් ෆෝලන් ඉල් සඩ්න්ලි , ෂී හැස් බොඩි වීක්නස් , අව(ර්) ෆැමිලි
ඩොක්ට(ර්) හැස් ආසක්ඩ් හ(ර් )ටු ටේක් රෙස්ට් ෆෝර ෆිව් ඩේස්
එයා හදිසියේ අසනීප වෙලා , එයාට ඇගට පන නැති ගතිය තියෙනවා ,අපේ
ෆැමිලි ඩොක්ට(ර්) එයාට කියලා තියෙනවා දවස් කීපයක් විවේක ගන්න කියලා

C- I see , I am sorry to hear about that . but do you have to go all the way from here to take care of her ? What about other family members ?
අයි සී , අයෑම් සොරි ටු හියර්) අබවුට් දැට් .බට් ඩූ යූ හැව් ටු ගෝ ඕල් ද
වේ ෆ්‍රොම් හිය(ර්) ටු ටේක් කෙයාරොෆ් හ(ර්) ? වට් අබවුට් අද(ර්) ෆැමිලි
මෙම්බ(ර්)ස් ?
මට කනගාටුයි ඒ ගැන අහන්න , නමුත් ඔයා මෙහෙ ඉදන්ම යන්න ඕනද
ඇයට බලා ගන්න ? එතකොට පවුලේ අනිත් අය ?
(Do you have to ...? - ඔයා කල යුතුද /ඔයා කරන්න ඕනද )
(all the way from here- මෙහෙ ඉදලම )

A- There's only my mother to help her , but she is ill too
දෙය(ර්ස්) ඔන්ලි මයි මද(ර්) ටු හෙල්ප් හ(ර්) බට් ෂී ඉස් ඉල් ටූ
මගේ අම්ම විතරයි ඉන්නේ එයාට උදව්වට , එයත් ලෙඩින්

C- But how much leave have you taken so far for the past 3 months ?
බට් , හව් මච් ලීව් හැව් යූ ටේකන් සෝ ෆා ෆෝ ද පාස්ට් 3 මන්ත්ස් ?
නමුත් පහුගිය මාස 3ට ඔයා කොච්චාර නිවාඩු අරන් තියෙනවද ?

A - Ten days sir
ටෙන් ඩේස් සර්
දවස් දහයයි සර්

C- That's too much leave, Sachin . Nobody has taken ten days off within 3 months. What are the reasons for taking so much leave ?
දැට්ස් ටූ මච් ලීව් සචින් . නෝ බොඩි හැස් ටේකන් ටෙන් ඩේස් ඕෆ් විතින් 3
මන්ත්ස් , වට් ආ ද රීසන්ස් ෆෝ ටේකින් සෝ මච් ලීව් ?
නිවාඩුනම් ගොඩාක් වැඩියි , සචින්. මාස 3ක් අතුලත දවස් 10ක් කිසිකෙනෙක් අරන්

නැහැ , එච්චර නිවාඩු ගන්න හේතු මොනවද ?

A - Because of various health problems of my wife , my mother or my children
බිකෝස් ඔෆ් වේරියස් හෙල්ත් ප්‍රොබ්ලම්ස් ඔෆ් මයි වයිෆ් , මයි මද(ර්) ඕ  මයි චිල්ඩ්‍රන්
එක එක සෞඛ්‍ය ප්‍රශ්න නිසා මගේ වයිෆ් ගේ , මගේ අම්මගේ නැත්නම් මගේ ළමයින්ගේ

C- I will give you two days leave . That's all I can do for you now . But please make sure you don't take any extra leave within the next couple of months
අයි විල් ගිව්  යූ ටූ ඩේස්  ලීව් , දැට්ස්  ඕල්  අයි කැන් ඩූ ෆෝ යූ නව්. බට් ප්ලීස් මේක් ෂුව(ර්) යූ ඩෝන්ට් ටේක් එනි එක්ස්ට්‍රා ලීව්  විතින් ද නෙක්ස්ට් කපලොෆ්  මන්ත්ස්
මම ඔයාට දවස් දෙකක් නිවාඩු දෙන්නම් , මට මේ වෙලාවේ ඔයාට් කරන්න පුළුවන් එච්චරයි, නමුත් ඊලග මාස කිහිපය  අතුලත ඔයා අමතර නිවාඩු නොගන්න වග බලාගන්න
(make sure කියන්නෙ වගබලාගන්න කියන එක)
(That's all - එච්චරයි That's all I can do  - මට කරන්න පුලුවන් එච්චරයි)

A - Thank you sir , Thank you very much .
තැනක් යූ ස(ර්) , තැනක් යූ  වෙරි මච්

**Vocabulary 43**

Resign – රිසයින් – ඉල්ලා අස්වෙනවා

Resignation – රෙසිග්නේෂන් – ඉල්ලා අස්වීම

Company – කම්පනි – සමාගම

Close down – ක්ලෝස් ඩවුන් –  වසා දමනවා

Renovate – රෙනොවේට් – නවීකරණය කරනවා

Renovation – රෙනොවේෂන් – නවීකරණය

Award – අවෝඩ් – සම්මානය , සම්මාන දෙනවා

Depart – ඩිපාට් – පිටත් වෙනවා

Departure – ඩිපාච(ර්) – පිටත් වීම

Mood – මූඩ් – මනෝභාවය

Refuse – රිෆියුස් – ප්‍රතික්ෂේප කරනවා

Refusal – රිෆියුසල් – ප්‍රතික්ෂේප කිරීම

Section – සෙක්ෂන් – කොටස

Weakness – වීක්නස් – දුර්වලතාව

Fatigue – ෆටීග් – අධික වෙහෙස

Sleepless – ස්ලීප්ලස් – නින්ද නැති

Sleeplessness – ස්ලීප්ලස්නස් – නින්ද නොමැති බව

Exert – එග්ස(ර්)ට් – වෙහෙස යොදනවා , ප්‍රයත්නය යොදනවා

Numerous – නියුමරස් – ගණනාවක්

Ailment – ඒල්මන්ට් – රෝගාබාධය

Lead – ලීඩ් – නායකත්වය දෙනවා, මඟ පෙන්වනවා

Leader – ලීඩ(ර්) – නායකයා

Lawsuit – ලෝසූට් – නඩුව

Munch – මන්ච් – විකා කනවා

Mumps – මම්ප්ස් – කම්මුල්ගාය

Pasture – පාස්ච(ර්) – තණබිම , සතුන් තණ කන භූමිය

Pupil – පියුපිල් – ශිෂ්‍යයා , ඇසේ කලු ඉංගිරියාව

Puncture – පන්ක්ච(ර්) – සිදුරු වීම / ටයරයක හුළං යාම

Sprain – ස්ප්‍රේන් – උළුක්කුව / උළුක්කු වෙනවා

Spout – ස්පවුට් – පීල්ල / කේතලයක, පෝච්චියක කට

Mathematics – මැතමැටික්ස් – ගණිතය

Mathematician – මැතමැටීෂන් – ගණිතඥයා

Method – මෙතඩ් – ක්‍රමය, විධිය
Methodically – මෙතඩිකලි – ක්‍රමානුකූලව, පිළිවෙළකට

Marsh – මාෂ් – වගුරු බිම, මඩ වගුර

Mask – මාස්ක් – වෙස් මුහුණ, මුඛ ආවරණය

Locate – ලොකේට් – ස්ථානය සොයා ගන්නවා , ස්ථානගත කරනවා , ස්ථානයක පිහිටුවනවා

Location – ලොකේෂන් – ස්ථානය, පිහිටීම

Livelihood – ලයිව්ලිහුඩ් – ජීවනෝපාය, ජීවිකාව

Wage – වේජ් – වැටුප (දිනපතා/පැයකට ගෙවන)

Salary – සැලරි – වැටුප (මාසික)

Literature – ලිටරෙච(ර්) – සාහිත්‍යය

Lift – ලිෆ්ට් – සෝපානය, එසවීම

Leprosy – ලෙප්‍රසි – ලාදුරු රෝගය

Leisure – ලෙෂ(ර්) – විවේකය, නිදහස් කාලය

Valid – වැලිඩ් – වලංගු, නීත්‍යානුකූල

Invalid – ඉන්වැලිඩ් – අවලංගු, වලංගු නොවන

Invisible – ඉන්විසිබල් – අදෘශ්‍යමාන, නොපෙනෙන

Invest – ඉන්වෙස්ට් – ආයෝජනය කරනවා

Investor – ඉන්වෙස්ට(ර්) – ආයෝජකයා

Human – හියුමන් – මනුෂ්‍ය, මිනිස්

Human Being – හියුමන් බීං – මනුෂ්‍යයා, මිනිසා

Humankind – හියුමන්කයින්ඩ් – මනුෂ්‍ය වර්ගයා, මනුෂ්‍ය සංහතිය

Humanity – හියුමැනිටි – මනුෂ්‍යත්වය,

Howl – හවුල් – උඩුබුරලනවා / උඩුබුරලීම,

Ghost – ගෝස්ට් – භූතයා, අවතාරය